**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**

# පුවත්පත් නිවේදනය

## ප්‍රවීණ සරෝද් වාදන ශිල්පීන් තිදෙනෙකු එකම වේදිකාවක - උස්තාද් අම්ජාඩ් අලි ඛාන්, අයාන් අලි බන්ගාෂ් සහ අමාන් අලි බන්ගාෂ්

ඉන්දියාවේ 70 වන ජනරජ දිනය නිමිත්තෙන් කොළඹ පිහිටි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් ප්‍රවීණ සරෝද් වාදන ශිල්පීන් වන උස්තාද් අම්ජාඩ් අලි ඛාන්, අයාන් අලි බන්ගාෂ් සහ අමාන් අලි බන්ගාෂ් විසින් මෙහෙය වන විශේෂ සංස්කෘතික ප්‍රසංගයක් සංවිධානය කර තිබේ. මෙය ඔවුන් විසින් ශ්‍රී ලංකාවේ පවත්වන ප්‍රථම සංගීත ප්‍රසංගය වන අතර සත්‍යජිත් තවල්කාර් සහ ශුභ් මහාරාජ් යන ප්‍රවීණ වාදන ශිල්පීන්ද මෙම ප්‍රසංගය සඳහා සහභාගී වේ.

20 වන ශත වර්ෂයේ ප්‍රවීණ සරෝද් වාදන ශිල්පියෙකු වන උස්තාද් අම්ජාඩ් අලි ඛාන් සිය පවුලෙන් මෙම හැකියාව උරුම කරගත් හයවෙනි පරම්පරාවට අයත් වේ. ඉන්දීය රජය විසින් පිරිනමන ලද පද්ම විභූෂණ සම්මානයද යුනෙස්කෝ සහ යුනිසෙෆ් වෙතින් පිරිනමන ජාත්‍යන්තර සම්මානද ඔහු විසින් හිමි කරගෙන ඇත. තම පියාගේ උරුමය ඉදිරියට ගෙන යමින් අයාන් අලි බන්ගාෂ් සහ අමාන් අලි බන්ගාෂ් ඉතාම ලාබාල වියේදීම ඔවුන්ටම අවේණික සුවිශේෂී හඬක් ගොඩනහා ගෙන ඇත.

මෙම ප්‍රසංගය ජනවාරි 25 වන සිකුරාදා ප.ව. 6.45 ට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වේ. නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ටාජ් සමුද්‍රා හෝටලයේ සහයෝගය සහිතව මෙය සංවිධානය කර ඇත.

මෙම ප්‍රසංගය නොමිලේ පවත්වනු ලැබේ. ප්‍රවේශ පත්‍ර සීමිත ප්‍රමාණයක් ජනවාරි 16 වැනිදා සිට ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකිය. වැඩි විස්තර ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය (කලින්

ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානය) මගින් ලබා ගත හැක. දු.ක. 011-2684698, විද්‍යුත් තැපැල. iccrcolombo2@gmail.com

*****

කොළඹ
2019 ජනවාරි 22